## 265 සදහම් දැහැමින්

සදහම් දැහැමින් ඇදහුම් සුවඳින් මංගල ගී මතුවේ
මංගල දිනයේ මංගල ගීතය සිරි සිරියා පතුරා
ලස්සන සැරසිලි කොඩිවැල් ලෙලදේ මංගල ගී නාදේ
හදවත ලස්සන පිබිදෙන දිනයක් වේවා සැමට මෙදා

වාසනාවයි සිරියාවයි දහම් අමාරස මිහිරාවයි
සැමහට මංගල වේවා
අප මංගල දිනයේ සමිඳුගෙ සෙනෙහසිනේ

එකමුතු මුතුහර දහමින් ඔප කර වපුරමු දෙරණ පුරා
දහමේ එළියේ වනසමු අවගුණ සදහට අප අතරින්
කිතු බැති සදහම් දරු කැළ අපි වෙමු දහමේ පෙරුම් පුරා
මංගල සිරියෙන් සරසමු ගම් බිම් දැහැමින් දිවිය ගෙවා

දුගියන් මගියන් දුප්පත් පොහොසත් එකටමැ දෙව්ඳු වැඳා
සමිඳුගෙ දරු මෙන් දෝතින් දෝතට මංගල සිරිය පතා
හදකින් හදකට වතකින් වතකට සෙනෙහස පවසාලා
සමිඳුන් පතනා ආදර ලෝකය අපි දැන් බිහි කරමු